


# සකාත් සහ සදකා හැඳින්වීම

## සකාත්

ධනය අල්ලාහ් මිනිසාට ලබා දී ඇති දයාදයකි. එය ලැබූවන් තමන් පමණක් එය ප්‍රයෝජනයට නොගෙන අන් අය අතර ද එය බෙදා හදා ගත යුතු ය. ඒ සඳහා වන ක්‍රමය ලෙස 'සකාතය' හා 'සදකාව' සඳහන් වන්නේ ය.

සකාත් යන වචනය පිරිසිදුකම, වර්ධනය, සංවර්ධනය, දයාදය වැනි විවිධ අදහස් සහිත ය. සකාත් මඟින් ලබා දෙන නිසා සකාත් ලබා දෙන්නාගේ වස්තු සංවර්ධනයත් අභිවෘද්ධියත් ඇති වන්නේ ය. ඔහුගේ සිත පිරිසිදුකම පරිත්‍යාගය, පරාර්ථකාමීත්වය වැනි යහ ගුණ ලබා ගන්නේ ය.

සකාත් යන වචනයේ පුළුල් අර්ථය දෙස බැලුවේ නම්, **සකාත් නියමවීමට කොන්දේසිවලට යටත් වන මුස්ලිම්වරුන් තම දේපොළ නියමිත (නිසාබයට පත් වූ පසු) අල්ලාහ් නියම කළ කිසියම් ප්‍රතිශතයක් එම කණ්ඩායම් අටක් අතර බෙදා දීම දැක්වෙන්නේ ය.** මෙය මූලික නැමදුම් අතර තෙවැන්න ද ඉස්ලාමීය ආර්ථිකයේ ජීවය ද වන්නේ ය.

අල් කුර්ආනය හා සුන්නාව මෙම වගකීම් පිළිබඳව දැඩි ලෙස අවධාරණය කර ඇත.

**"තව ද සලාත් හි නිරත වනු. සකාතය ද දෙනු....." (2 : 110)**

**"කවරකු අල්ලාහ් තම දයාදවලින් ලබා දී ඇති දේවල් සම්බන්ධයෙන් මසුරු වන්නේ ද ඔවුන් එය තමන්ට හොඳ යැයි නොසිතිය යුතු ය. එය ඔවුනට නරකක් ම වනු ඇත.**

**මසුරුකමින් රැස් කරගත් දේවල් කියාමාවේ දී ඔවුන්ගේ බෙල්ලෙහි යකඩ වළලු ලෙසින් පලඳවනු ලැබෙන්නේ ය." (3 : 180)**

අල්ලාහ් අල් කුර්ආනයේ සලාතය සමග එක් කොට සඳහන් කර ඇති එක ම වගකීම සකාත් වන්නේ ය.

මෙය එහි ඇති වැදගත්කමට හා සුවිශේෂත්වයට මුස්ලිම් වරයකුගේ ජීවිතයේ අත්‍යඅවශ්‍ය අංගයක් වන සලාතය යන නැමදුම නිසි ලෙස සිදුවුවහොත් සියළුම ක්‍රියා නිසි අයුරින් සිදුවේ යන්නෙන් වර්ණනා කරන ලද නැමදුමකි. පරලොව ප්‍රශ්න කිරීම් වලදී ප්‍රථමයෙන් අසනු ලබන පැණය ද සලාතන ගැනම වේ.මෙවැනි වැදගත්කමක් ඇති සලාතයක් සමග එක්ව අල් කුර් ආනය සකාතය සඳහන් කරන තිබිම එහි විශිෂ්ඨත්වයට හා වැදගත්කමට එක් ප්‍රධාන වු සාකෂියකි.

ඉබ්නු මසුඌද් රළියල්ලාහු අන්හු තුමාණෝ මෙසේ දන්වති.

"සලාතය ඉටුකරන ලෙස ද සකාත් දෙන ලෙස ද අණ කරනු ලැබ ඇත. කවුරුන් සකාත් නොදුන්නේ ද ඔහුට සලාත නොමැත. (තබ්සීර් තබරි 14:153)

සකාතයේ වැදගත්කම විවිධ හදීස් මඟින් අවධාරණය කරයි.

"සකාත් මගින් ඔබ ඔබගේ දේපොළ ආරක්ෂා කර ගන්න" (අබූ දවූද්)

" සකාත් නොදී වැළකෙන සමාජය අල්ලාහ් දුර්භික්ෂය මගින් පරීක්ෂා කරන්නේ ය." (තබරාානි)




**සකාත් වගකීම විධිමත් අයුරින් ඉටු කළේ නම් සමාජය ඉන් ප්‍රයෝජන ලබයි; ධනය වර්ධනය වෙයි. අල්ලාහ්ගේ ආරක්ෂාව හිමිවෙයි. දුර්භික්ෂය ඉවත් වෙයි. දුප්පත්කම නැති වෙයි; ආර්ථික උස් පහත්කම් අඩුවෙයි. දුප්පතුන්ගේ මූලික ගැටලු නැති වෙයි; අපරාධ අඩුවෙයි; සාමය හා සෞභාග්‍ය පිරි සමාජයක් බිහි වෙයි. කියාමාවේ දී විමුක්තිය ලැබෙයි.** සකාත් ඉස්ලාමයේ පස් මහ යුතුකම්වලින් එකක් ලෙස ද දක්වා ඇති අතර සකාත් නම් වූ දුගී බද්ද ගෙවීම නොකර සිටීම දඬුවම් ලැබීමට හේතුවක් ද වන්නේ ය.

## සදකා

සකාත් සහ සදකා යන පදවල අර්ථය ආසන්න වශයෙන් සමාන වූව ද ඒවා අතර යම් යම් වෙනස්කම් ද දක්නට ඇත. අල් කුර්ආන් සදකා යන පදය සකාත් යන අදහසින්, විවිධ ස්ථානවල යොදා ඇත. එහෙත් එයින් පොදු අර්ථයක් ලබා දෙන්නේ ය. සදකා සුන්නත් වූ ක්‍රියාවකි.



**මිනිසෙකු තම දේපොළින් කොටසක් තවත් අයකුට අල්ලාහ්ගේ තෘප්තිය වෙනුවෙන් ලබා දීම සදකා යන වදනින් අදහස් කෙරේ.** මෙම පදය ඉතා පුළුල් අර්ථයකින් භාවිත වේ. ධනය ආදිය මගින් දෙනු ලබන දානයක් පමණක් නොව ක්‍රියා මගින් ද මෙය ඉටු කෙරේ. පහත හදීසය මගින් මෙය පැහැදිලි කරයි.

ඔබ ඔබගේ සොහොයුරාගේ මුහුණ දෙස බලා මඳහස පෑම ද සදකාවකි. ඔබ යහපත පනවා අයහපත වැළැක්වීම ද සදකාවකි. පාර නොපෙනෙන අයකුට පාර පෙන්වීමත් සදකාවකි. පාරේ තිබෙන ගල් මුල් ආදිය ඉවත් කිරීමත් සදකාවකි. ඔබගේ දිය බඳුනෙන් මිතුරාගේ දිය බඳුනට දිය බෙදා හැරීම ද සදකාවකි. අන්ධයකුට මග පෙන්වීමත් ඔබට සදකාවකි. (බුහාරි)

මෙමගින් සදකා යන්න පුළුල් වූ අදහසක් ඇති යහ ක්‍රියාවක් බව වැටහෙන්නේ ය. මෙහි සුවිශේෂත්වය අල් කුර්අනයේ මෙලෙස දක්වේ.

**"විශ්වාසවන්තයින් කවුරුන් තම වස්තු අන්‍යයන්ට උදවු කිරීමේ අරමුණින් රාත්‍රි කාලයේ හා දහවල් කාලයෙහි රහසිගතව සහ ප්‍රසිද්ධියේ වියදම් කරන්නේ ද ඔවුනට හිමි කුලිය ඔවුන්ගේ අල්ලාහ්ගෙන් ඔවුනට ලැබෙනු ඇත. තව ද ඔවුන්ට (කියාමාවේ දී) කිසිදු බියක් නොමැත. ඔවුන් දුක් වන්නේ ද නැත." (2:274)**

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවැසූහ. දන් පින් කරන්නෝ අල්ලාහ්ගේ සමීපයේ සිටිති. ඔවුහු මිනිසුන්ට ආසන්නයේ සිටිති. ඔවුහු ස්වර්ගයට ආසන්නයේ සිටිති. නිරයට බොහෝ දුරින් සිටිති. මසුරු වූ විශ්වාසවන්තයෙකුට වඩා පරිත්‍යාගශීලී වූ ද දන් පින් කරන්නා වූ ද මෝඩයකු අල්ලාහ්ට කැමැත්තේ ය." (තිර්මිදි)

වස්තු දේපොළවලට ආශා කිරීමත් ඒවා රැස්කර තැබීමත් මිනිස් ස්වභාවයකි. එහෙත් අන් අයට දන් පින් නොකර එක් රැස්කර තබන්නා විවිධ දුක්වේදනාවලට කියාමාවේ දී මුහුණ දෙන බව අල් කුර්ආන් අවධාරණය කරයි. දෙවියන්ගේ මාර්ගයෙන් වියදම් කිරීමට

ඉදිරිපත් වන විට ෂෙයිතාන් එය වළක්වන්නේ ය යැයි, නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ පැවැසූහ. අයකු තම ධනයෙන් දන් දීමට ඉදිරිපත් වනවිට ෂයිතාන්වරු 70 දෙනෙක් ඔහු වෙත දුවමින් එය දීම වැළැක්වීමට ඉදිරිපත් වෙති. (අහ්මද්)

මෙම අවස්ථාවේ දී මිනිසා ෂයිතාන් ජය ගෙන ධාර්මික කටයුතුවල යෙදෙනවිට ඔහු මලාඉකාවරුන්ගේ ප්‍රාර්ථනාවලට ලක් වෙති. දිනපතා ම මලක්වරු දෙදෙනෙක් පොළොවට පහත් වෙති. එයින් අයකු යා අල්ලාහ්, යහපත් මාර්ගවලින් වියදම් කරන අයට ඔබ තව තවත් ලබා දෙනු මැනවි, යැයි පවසයි. අනික් මලක්වරයා හා අල්ලාහ් කිසිවක් නොදී සිටින කුහකයාට විනාශය අත්කර දෙත්වා යැයි ප්‍රාර්ථනා කරයි. (මුස්ලිම්)

**සකාත්, සදකා අතර වෙනස පහත දැක්වේ.**

| සකාත් | සදකා |
|---|---|
| ● ෆර්ල් | ● සුන්නතයකි |
| ● නියමිත වස්තු කිහිපයකට පමණක් අනිවාර්ය ය. | ● ඕනෑ ම දෙයක් සඳහා වලංගු ය. |
| ● කිසියම් පිරිසකට පමණක් යුතුකමකි. | ● කැමැති ඕනෑ ම අයෙකුට දිය හැකි ය. |
| ● කෙසේ දිය යුතු ද යන කොන්දේසිය ඇත. | ● කැමැති අයුරින් කැමැති ප්‍රමාණයක් දිය හැකි ය. |
| ● අල්කුර්ආනයේ දක්වා ඇති පිරිස් අටකට පමණක් දිය යුතු ය. | ● කැමැති අයකුට දිය හැකි ය. |
| ● දේපළ, වස්තුව නියමිත ප්‍රමාණයට පත් වී තිබිය යුතු ය. | ● තමා ළඟ කොපමණ තිබුණත් දිය හැකි ය. |
| ● දේපළ, වස්තුව නියමිත කාලයට යටත්ව තිබිය යුතු ය. | ● නියමිත දේපළ නියමිත කාලයක් ද යන කොන්දේසි කිසිවක් නොමැත. |

**එහෙයින් සකාත්, සදකා යන යුතුකම්වල වැදගත්කම වටහාගෙන ඒවා අපගේ ජීවිතයේ දී අනුගමනය කරමින් ජීවිතය ජය ලබමු.**

## පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

صَدَقَةٌ    زَكَاةٌ

**අභ්‍යාස**

(අ) පහත ප්‍රකාශවලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා ඒවා යටින් ඉරි අඳින්න.

1. සකාත් යන පදයේ භාෂාමය අර්ථය ( බදු, ධනය, පිරිසිදුකම)
2. සදකා යන්නෙහි අදහස ( හිඟමන් දීම, දන් දීම, ආහාර දීම)
3. සදකා යන යහ ක්‍රියාව (සුන්නත්, වාජිබ්, ෆර්ල්)
4. අල් කුර්ආනය සලාතය සමඟ සම්බන්ධ කර අවධාරණය කළ යුතුකම (සව්මය, සකාතය, හජ්)
5. සකාත් දීමෙන් ධනය (වර්ධනය වේ, අඩු වේ, විනාශ වේ)

(ආ) කෙටි පිළිතුරු ලබා දෙන්න.

1. සකාත් යන්නෙහි අර්ථය කුමක් ද?
2. සකාත් සදකාවලින් වෙනස් වන්නේ කෙසේ ද ?
3. සකාතයේ වැදගත්කම දක්වන සාධක දෙකක් ඉදිරිපත් කරන්න.
4. සදකාවෙහි වැදගත්කම දක්වන අල් කුර්ආන් වැකි දෙකක් තෝරා ලියන්න.
5. සකාත් වගකීමෙහි වැදගත්කම දක්වන සකාත් හි වැදගත්කම ප්‍රකාශවන දේශනයක් සකස් කරන්න.

**ක්‍රියාකාරකම**

ඔබගේ ජීවිතයේ සදකා සිදු කරන්නේ කෙසේ ද යන්න හා ඒ සඳහා වන මාර්ග සාකච්ඡා කර ලියන්න.